# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

24/2, 28th Lane, Off Flower Road, Colombo 7.
**Tel: 11 4062180-190, 011 2565304, Fax: 011 4714460, 0114503001**.
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cmev.org


## Presidential Election 2015

## Media Communique 5

**On 27th December 2014 at 7.00 pm:**

**Offering letter to offer permanent jobs at Civil Security Department during the period of Presidential Election – 2015**

CMEV received a complaint from a Civil Security Officer that many employees at the Civil Security Department (CSD) have been given permanent jobs effective from 19th Dec 2014. He repeatedly asked CMEV not to reveal his identity, as he believed that his job would be in jeopardy. Further he said that thousands of civil security officers have been given letters making them permanent, after many years as temporary employees. According to him thousands of CSD officers are being used for President Mahinda Rajapaksha 's election campaign by making their temporary jobs permanent .

According provision no 7 of the circular issued by Department of Election on 2nd Dec 2014, no person can be offered a job in the government sector after the declaration of the Presidential Election. In the letter, a copy of which CMEV received from the complainant and is attached, it is clearly stated that this officer will come under the category of a permanent government servant effective from 19th Dec 2014. This is a serious violation of Election Law.

CMEV was formed in 1997 by the Centre for Policy Alternatives (CPA), the Free Media Movement (FMM) and the Coalition Against Political Violence as an independent and non-partisan organisation to monitor the incidence of election related violence. Currently, CMEV is made up of CPA and INFORM Human Rights Documentation Centre.

**All CMEV reports and communiqués can be accessed online at www.cmev.org**

Dr. P. Saravanamuttu
Co – Convener

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව,
අංක:23,
දුම්රියපොල පාර,
බම්බලපිටිය,
කොළඹ -04.
2014 11. 28

..................................................මයා/මිය/මෙනවිය
..................................................................
..................................................................
..................................................................

මහත්මයාණෙනි/මහත්මියෙනි/මෙනවියනි,

## සිවිල් ආරක්ෂක (ස්වේච්ඡා) බලකායේ ග්‍රාමාරක්ෂක/සිවිල් ආරක්ෂක තනතුරට පත්කිරීම

ඔබ.................................. දින සිට ක්‍රියාත්මක වන පරිදි සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි සිවිල් ආරක්ෂක (ස්වේච්ඡා) බලකායේග්‍රාමාරක්ෂක/සිවිල් ආරක්ෂක තනතුරට පත් කරනු ලබන බව මෙයින් සතුටින් දන්වමි.

2. ඒ අනුව ඔබ මතු කී දින සිට සිවිල් ආරක්ෂක (ස්වේච්ඡා) බලකායේ සාමාජිකයෙකු වේ.ඔබගේ සමස්ථ සක්‍රීය සේවා කාලය වසර 20 සම්පූර්ණ කිරීමෙන් පසුව ඔබ විශ්‍රාම වැටුපකට හිමිකම ලබයි. තවද ඔබ වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනාත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුවේ. ඔබගේපත්වීම පෙරදාතම කර ඇති බැවින් ඔබ වැන්දඹු හා අනාත්දරු අරමුදලට ගෙවියයුතු දායක මුදල් නිශ්චය කොට ඔබ හට ගෙවීමට ඇති රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලෙන් හිලව් කිරීමටත් තව දුරටත් හිඟ මුදලක් වේ නම් ඔබගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය කරනු ලැබේ.

3. ඔබ විසින් මෙම තනතුර ජනතාව වෙනුවෙන් වන භාරයක් ලෙස දරනු ලැබිය යුතුය. එම තනතුරට අදාල සියලු රාජකාරි හා වගකීම් මෙම දේශයේ හා එහි ජනතාවගේ යහපත වෙනුවෙන් කාර්යක්ෂමව හා අනලස්ව ඉටුකළ යුතුවේ.

4. ඔබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට උපරිම වශයෙන් පක්ෂපාතී විය යුතු අතර, අදාළ පරිදි රාජකාරීයෙහි රහස්‍ය භාවය පූර්ණ වශයෙන් ආරක්ෂා කල යුතුය.

5. ඔබ රජයේ සේවයේ නියැලී සිටින කාලය තුළදී වෙනත් ආයතනයක රැකියාවක නියැලීමට හෝ වෙනත් වෘත්තියක නියැලීමට හෝ ඔබට හිමිකමක් නොමැත.

6. මෙම පත්වීම් ලිපියෙන් බැඳුණු යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කරමින්ද, යහපත් හැසිරීම තුළින්ද, කාර්යක්ෂම ලෙස සේවය කිරීම තුළින්ද ඔබ රජයේ සේවය සඳහා සුදුස්සෙකු බව එම කාලය තුළදී සනාථ කළ යුතුවේ. එසේම ඔබ විසින් සම්පූර්ණ කළ යුතු බඳවා ගැනීමේ පරිපාටියෙහි දක්වා ඇති අනෙක් අවශ්‍යතා සපුරාලීමට ද ඔබ වග බලා ගත යුතුය. මෙම සියලු අවශ්‍යතා යථා පරිදි සපුරාලීමට ඔබ අපොහොසත් වුවහොත් ඔබගේ පත්වීම අවසන් කළ හැකිවේ.

7. මෙම පත්වීමග්‍රාමාරක්ෂක/සිවිල් ආරක්ෂක තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියෙහි දක්වා ඇති සියලු කොන්දේසි හා විධිවිධානවලට පූර්ණ වශයෙන් යටත් වේ.

..................02 පිටුවට

8. මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය පහත පරිදි වේ.

වැටුප් සංකේත අංකය:- PL 02-2006 A
වැටුප් පරිමාණය :- 12210-130x10-145x10-160 x10-170 x12-18600

බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි ඔබගේ තනතුර අනුව ඔබ රු.12210/=ක මාසික වැටුපකට හිමිකම් ලබති.රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද ඔබට හිමිවේ. කෙසේ වුවද ඔබ සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දින හැර අනෙකුත් සියලුම දිනයන්හි රාජකාරි කළ යුතු අතර, එසේ සේවය නොකරන දිනයන් ඇති විට එම දිනයට/ දිනයන්ට අදාල දෛනික වැටුප ඔබගේ මාසික වැටුපෙන් අඩු කරනු ලැබේ. තවද රජයේ නිලධාරීන්ට ගෙවනු ලබන අනෙකුත් සියලුම දීමනාද ඒ අනුව සමානුපාතිකව අඩු කරනු ලැබේ..වැටුප් තලය ඉක්මවා යාමට පෙර කාර්යක්ෂමතා කඩඉම ඔබ සමත් විය යුතුය. අනුමත කාලය තුළදී කාර්යක්ෂමතා කඩඉමක් ඉක්මවා යාමට ඔබ අපොහොසත් වුවහොත්, ආකාර්යක්ෂමතාව මත ඔබගේ පත්වීම අවසන් කරනු ලැබේ.

9. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධයෙන් පනවනු ලබන සියලු රීති, රෙගුලාසි, නියෝග හා කාර්ය පටිපාටිවලට අනුගතව ඔබ රාජකාරි වගකීම් හා යුතුකම් ඉටුකළ යුතුවේ. එසේම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස් වලට ද ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධන වලටද ඔබ යටත් විය යුතුවේ.

10. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තීරණය කරනු ලබන ආකාරයට හා තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයකින් රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුව ඇපයක් තැබීමට ඔබ බැඳී සිටියි.

11. සාමාන්‍ය තත්ත්වය යටතේ රාජකාරි දිනයන්හි රජය විසින් නියමිත කාල සීමාවන් තුළ ඔබ රාජකාරියෙහි නියැලිය යුතු වුවද, ඔබ දරන තනතුරට අදාළ රාජකාරි වගකීම්අනුව ඕනෑම දිනයක ඕනෑම වේලාවක රාජකාරී ඉටු කිරිමට බැඳී සිටියි.

12. ක්ෂණිකව හෝ කල්දීමක් සහිතව හෝ කරනු ලබන විධිමත් දැන්වීමක් මත දේශයේ ඕනෑම ප්‍රදේශයකදී මෙම තනතුරෙහි රාජකාරී වගකීම් ඉටු කිරීමටද ඔබ බැඳී සිටියි.

13. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවයේ යෙදවීමට තරම් යෝග්‍ය වන යහපත් මානසික හා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් ඔබ යුක්ත බව මෙම පත්වීම භාරගෙන මාස තුනක් ඉකුත් වීමට පෙර විධිමත් වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ කළ යුතුවේ. පොදු 169 හා සෞඛ්‍ය 169 දරණ ආකෘති පත්‍ර උපයෝගී කර ගනිමින් රජයේ රෝහලක කාර්ය භාර වෛද්‍ය නිලධාරයා මගින් මෙම වෛද්‍ය පරීක්ෂණ වාර්තාව ලබාදීම ඔබගේ වගකීමක් වේ.

14. ඔබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 4 වන හා 7 වන උපලේඛන ප්‍රකාරව ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුවේ. නීතියෙන් නියම කර ඇති එම ප්‍රතිඥාව/දිවුරුම ලබාදීමට ඔබ අපොහොසත් වුවහොත් , ඔබ වෙත ලබා දී ඇති මෙම පත්වීම නිරායාසයෙන්ම අහෝසි වේ.

15. මෙම පත්වීම භාර ගැනීමට පෙර ඔබ විසින් ඔබගේ අනන්‍යතාව යථා පරිදි තහවුරු කළ යුතුය.

.................03 පිටුවට

**සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව**
**சிவில் பாதுகாப்பு திணைக்களம்**
**CIVIL SECURITY DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No: සිඑස්ඩී/ඩීපීඕ/ඒ/15/2 (227) ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 2014.12.19

සිවිල් ආරක්ෂක බළකායේ සියළුම සාමාජික සාමාජිකාවන් වෙත,

<u>සේවය ස්ථිර කිරීම හා විශ්‍රාම වැටුප් ප්‍රධානය</u>

යොමුව : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ 2014.12.14 දිනැති ලිපිය.
(ප්‍රතිශත චක්‍රය)

1. අප බලකායේ සියළුම සාමාජික සාමාජිකාවන්ගේ සේවය ස්ථිර කර විශ්‍රාම වැටුප් ලබා දීමේදී 2006.01.02 වන දින සිට අනුගමනය කරනු ලබන විශ්‍රාම වැටුප් ගණන් ගැනීමේ ප්‍රතිශත චක්‍රයේ පිටපතක් ඔබගේ දැන ගැනීම සඳහා මේ සමඟ ඉමහත් සතුටින් ඉදිරිපත් කරමි.

2. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් එවා ඇති මෙම ප්‍රතිශත චක්‍රය ප්‍රකාරව වෙනත් රජයේ සේවකයන් මෙන්ම වසර දහයක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සෑම සාමාජික සාමාජිකාවකටම විශ්‍රාම වැටුප් හිමිකම් ප්‍රධානය කිරීමත්, සේවයෙහි ස්ථිර කිරීම පිළිබඳවත් මාගේ සතුට සමඟ සුභ නව වසරක් සඳහා සුභාශිංසන පිරිනමමි.

ආනන්ද පීරිස් ආර්එස්පී* විඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඩීඅයිඑස්එස්
රියර් අද්මිරාල්
අධ්‍යක්ෂ ජනරාල්

දුරකථන (අධ්‍යක්ෂ ජනරාල්) / தொலைபேசி பணிப்பாளர் நாயகம் / Telephone DG: 011-2588116
ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2588117
අංක : 23, දුම්රියපොල පාර, බම්බලපිටිය,
இல. 23, புகையிரத வீதி, பம்பலப்பிட்டிய
No.23, Station Road, Bambalapitya
හුවමාරුව / பரிமாற்றகம் / Exchange: 011-2554897, 011-2553767
ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-5349703

2014/12/14

මගේ අංකය : CSD/WEL/A/08(178)

අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක බලකාය

ඔබේ ඉහත අංක අනුව 2014.12.19 වන දිනැති ලිපිය හා බැඳේ

## 2006.01.02 දින සිට විශ්‍රාම ලබන විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ ප්‍රතිශත චක්‍රය

| සේවා කාලය | අවු 10 | අවු 10 මාස 06 | අවු 11 | අවු 11 මාස 06 | අවු 12 | අවු 12 මාස 06 | අවු 13 | අවු 13 මාස 06 | අවු 14 | අවු 14 මාස 06 | අවු 15 | අවු 15 මාස 06 | අවු 16 | අවු 16 මාස 06 | අවු 17 | අවු 17 මාස 06 | අවු 18 | අවු 18 මාස 06 | අවු 19 | අවු19 මාස 06 | අවු20 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විශ්‍රාම ලබා ගන්නා අවස්ථාවේ දී ලැබූ | | | | | | | | | | | | | | | | | | | | | |
| සිවිල් ආරක්ෂක භට රු.145800/- | 55 | 56 | 57 | 58 | 59 | 60 | 61 | 62 | 63 | 64 | 65 | 66 | 67 | 68 | 69 | 70 | 71 | 72 | 73 | 74 | 75 |
| සිවිල් ආරක්ෂක උප නියාමක රු.160200/- | 54 | 55 | 56 | 57 | 58 | 59 | 60 | 61 | 62 | 63 | 64 | 65 | 66 | 67 | 68 | 69 | 70 | 71 | 72 | 73 | 74 |
| සිවිල් ආරක්ෂක නියාමක | 51 | 52 | 53 | 54 | 55 | 56 | 57 | 58 | 59 | 60 | 61 | 62 | 63 | 64 | 65 | 66 | 67 | 68 | 69 | 70 | 71 |
| සිවිල් ආරක්ෂක දිස්ත්‍රික් නිලධාරී රු.190800/- | 50 | 51 | 52 | 53 | 54 | 55 | 56 | 57 | 58 | 59 | 60 | 61 | 62 | 63 | 64 | 65 | 66 | 67 | 68 | 69 | 70 |

විශ්‍රාම වැටුප ගණනය කරනුයේ සේවා කාලය හා වැටුප පදනම් කරගෙනය.
සේවා කාලය අවු 25ට වැඩි අය සඳහා ඇමුණුම A පරිදි අඩු නොකළ ප්‍රතිශතය ලබා ගන්න
සේවා කාලය අවු 20 සිට 25 දක්වා වැඩි වන මාස 06කට 1% බැගින් එකතු කර ප්‍රතිශතය ලබා ගන්න
සේවා කාලය අවු 25ට අඩුවන අවස්ථාවලදී මාස 06කට අඩු සේවා කාලය සඳහා 1% බැගින් අඩුකරනු ලැබේ.

එස්.එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

එස්. එස්. හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10